Department of Education Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපනදෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල**

විෂය : නාට්‍ය හා රංගකලාව

සතිය : 05

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය

සකස් කිරීම : මාවනැල්ල කලාපය

## පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි පාදක කොටගෙන නිර්මාණාත්මක රංගනයේ යෙදීම

අප ජීවත්වන සමාජයෙන් පරිසරයෙන් වටපිටාවෙන් විවිධාකාර අත්දැකීම් වලව අපට මුහුණ දෙන්නට සිදුවේ. එම අත්දැකීම් සුබදායක, දුක්ඛදායක, හෝ ප්‍රහසනාත්මක අත්දැකීම් වේ. ඒවා මිනිසා සම්බන්ධ හෝ සතුන් සම්බන්ධ අත්දැකීම් වේ. එවැනි අත්දැකීම් මගින් අපට අවස්ථා නිරූපණයන් කළ හැක. එවැනි සියලු සිද්ධීන්ට අදාළ සුවිශේෂී වාග්මාලාවක් පවතී. ඊට අමතරව එවැනි සිද්ධිවලින් ජීවිතයට යම් අරුතක්ද එක්වේ. ශ්‍රේණිය



**මෙකී අවස්ථා නිර්මාණාත්මකව පරිකල්පනය මෙහෙයවා ගොඩනැංවීමෙන් අපූරු චමත්කාරයක් ඇතිවේ. පරිකල්පනය යනු පෙර කිසිවිටකත් මුහුණ නොදුන් තත්වයක් මවා ගැනීමයි.**

**අප පරිසරය ආශ්‍රිත මුහුණ දෙන අත්දැකීම් කිහිපයක් පහත දැක්වේ. ඒ ඇසුරින් ඔබ නිර්මාණාතමකව රංග ක්‍රියාවන් හී යෙදෙන්න.**

- කටුගාලක පැටලුණු අයෙකු ඉන් මිදීමට උතසහ කරන අවස්ථාවේ පිහිටට පැමිණි අයද කටුගාලේ පැටලීම.
- මංගල උත්සවයකට යන පිරිසක් පයින් මනාලයාගේ නිවසට යද්දී ඇදවැටුණු මහ වැස්ස නිසා මනාළ යුවළ ගේ ඇඳුම් පැළඳුම් නොතෙමා බේරාගැනීමට තැත් දරණ පිරිසක්.
- කුඩු කර සිටින හා පැටියෙකු කූඩුවෙන් පැනයාම හා ඌ නැවත කූඩුවට දැමීමට කරන උත්සහයෙදී ඌ ලන්දකට පැනයාම හා ලන්ද පීරා හාවා සෙවීම.
- ගසකින් කොස් ගෙඩියක් කඩන්න ගොස් හිසට කොහොල්ලෑ ගොඩක් වැටීම නිසා එය ඉවත් කර ගැනීමට අන් අයගේ උදවු පතන කාන්තාවක් හා උදවුවට පැමිණි අයගේ ඇගේ කොහොල්ලෑ ගෑවීම නිසා අපහසුතවට පත්වීම.
- මෙසේ සිදුවීම් අපූරු ලෙස ගොඩනැංවීම සඳහා,

- 1 උචිත සංවාද
  2 රංග වස්ත්‍ර
  3 රංග භාණ්ඩ
  4 පසුතල
  5 සංගීතය ආදිය යොදාගැනීම නිසා නිර්මාණය අපූර්ව වේ.



1) බොහෝ විට මෙම නිර්මාණ කණ්ඩායම් වශයෙන් ද සිදුකළ හැක. කෙසේ වෙතත් තමා රගන චරිතයක් තෝරාගතයුතුය.

ඒඅනුව චරිත කිහිපයක් ගොඩනැගිය හැක.

උදා : කටුගාලේ පැටලුණ පුද්ගලයා

: ඔහු මුදා ගැනීමට පැමිණෙන පිරිස

: පැමිණෙන පිරිසේ කලබලකාරී අයෙක්

: සන්සුන්ව පැටලුම ලිහන්නෙක්

: හඬා වැටෙන අයෙක්

2 ) සිදුවීම මුල මැද අග ලෙස පෙළ ගස්වා ගැනීම.

උදා ආරම්භය : කෙනෙකු වැටකින් රිංගීමට ගොස් එහාපස තිබූ කටුගාලක පැටලීම

: එයින් මිදීමට යාමේදී තව තවත් එහිම ඇලීම

මැද : උදවු ඉල්ලා කෑගැසීම

: උදවුවට පැමිණ පිරිසද පැටලීම

අවසානය : අවසානයේ අපහසුවෙන් කටුගාලෙන් මිදීම




3 ) සාමූහිකව කටයුතු කිරීම

4 ) උචිත පරිදි සංවාද ඇඳුම් පැළඳුම් රංගභාණ්ඩ යොදා ගැනීම.

පැවරුම් :

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ඔබට පරිසරය ආශ්‍රිත අවස්ථා හා සිද්ධි පාදක කොටගෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම් වල නිරත වන්න.